ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: GS/SP/EST/1/1/01 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2025.05.17 |

19 MAY 2025

D/F

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම (ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය - ආපදා ණය)**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක CSS/07/13/1/vol(1) හා 2025.05.14 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් ඉල්ලා සිටි පරිදි දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2025.05.09 දිනැතිව නිකුත් කර ඇති අංක: 12/2025 චක්‍රලේඛය දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා, ඔබගේ නිර්දේශ අනුව 2025.05.17 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව කාරුණිකව දන්වමි.

03. එහි පිටපත අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි.

එච්.ඩී.ඩී.එස්.ඩබ්. හේරත්
සහකාර ආණ්ඩුකාර ලේකම්,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையகம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2025

මගේ අංකය : EST-6/04/LON/1030
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.05.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය - ආපදා ණය

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2008.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2008 සහ 2025.03.22 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2025 හි 04.4 උපවගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. 2025 අයවැය යෝජනා මඟින් රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප වැඩිකිරීම සැලකිල්ලට ගෙන රාජ්‍ය සේවකයන් සඳහා ආපදා ණය ලබාදීමේ උපරිම සීමාව දැනට පවතින රු. 250,000/- සිට රු. 400,000/- දක්වා ඉහළ නැංවීමට රජය තීරණය කර ඇත.

03. ඉහත විධිවිධාන අනුව, නිලධරයාට හිමිවන ණය මුදල තීරණය කිරීමේ දී නිලධරයාගේ වැටුප ලෙස 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන IIහි මූලික වැටුප අදාළ කරගනිමින් නිලධරයා ලබන මාස දහයක වැටුප හෝ රු. 400,000/- ක් හෝ යන දෙකෙන් අඩු මුදල ගෙවිය යුතු ය.

04. ඒ අනුව, නිලධරයෙකු ණය/ අත්තිකාරම් ලබාගැනීමේ දී සලකා බලනු ලබන වැටුපෙන් 40% සීමාව ගණනය කිරීමේ දී නිලධරයාගේ වැටුප ලෙස 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන IIහි මූලික වැටුප අදාළ කර ගත යුතු ය.

05. තවද, ආපදා ණය මුදල ආපසු අයකිරීමේ දී පාදක කර ගත යුතු වැටුප ලෙස 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන IIහි මූලික වැටුප අදාළ කර ගත යුතු ය.

එච්.ඩී.එස්.එච්. හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

06. එහිදී, පවත්නා උපරිම සීමාවන් ඉක්මවා නොයන පරිදි සහ වර්ෂය තුළ ණය ලබාදීම සිදු කිරීමට හැකි වන පරිදි, සුදුසු ප්‍රමුඛතා අනුපිළිවෙළ ඒ ඒ ආයතනය විසින් සකස් කරගත යුතු ය.

07. මෙම විධිවිධාන 2025.05.01 දින සිට ක්‍රියාත්මක වේ.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk


මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය ....චක්‍රලේඛ.... 12/2025 ....චක්‍රලේඛය / උපදෙස් ලිපිය ....මැයි 01.... දින සිට දකුණු පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ....2025/05/17.... දින ලබා දී ඇති බව සහතික කරමි.

..............................
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / සහාය.

[illegible]
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත